# 1818 උඩරට මහ කැරැල්ලෙන් ගම් බිම් අතහැර පලා ගිය බෞද්ධ ජනතාවගේ ඇදහිලි හා විශ්වාස

## (ඌව පළාතේ තෝරා ගත් ගම්මාන කිහිපයක් ඇසුරිනි)

ඩී. ඩී. එල්. නිරෝෂිමාලා[1]

ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් 16 වන සියවසේ මුල් භාගයේ සිට පෘතුගීසි, ලංදේසි හා ඉංග්‍රීසි යන යුරෝපා ජාතීන්ට පිළිවෙළින් යටත් වන අතර දේශීය ජනතාවගේ ද උපකාර ලබා ගනිමින් උපක්‍රමශීලීව මෙතෙක් පැවති යුරෝපා ජාතීන්ට අවනත කර ගැනීමට අපහසු වූ කන්ද උඩරට සෙන්කඩගල රාජ්‍යය 1815 දී ඉංග්‍රීසීන් විසින් ජයග්‍රහණය කිරීමත් සමග ලක්දිව ස්වාධීන යුගයේ නිමාව සටහන් වේ. ඉංග්‍රීසි පාලන ප්‍රතිපත්ති හා උඩරට ගිවිසුමේ පොරොන්දු කඩ කිරීමෙන් අපේක්ෂා භංගත්වයට පත් වූ දේශීය ප්‍රභූන්, භික්ෂූන් හා ජනතාව ඉන් ශතවර්ෂ තුනක් ගත වීමත් සමග ඉංග්‍රීසීන්ගෙන් ස්වාධීනතාව පතා නිදහස් අරගලයක නිරත වන අතර 1818 උඩරට මහ කැරැල්ල නමින් ඉතිහාස ගත වී ඇත්තේ මෙකී සංසිද්ධියයි. 1818 කැරැල්ල හේතුවෙන් පලා ගිය ජනතාව ඈත වනයෙහි නව ජනාවාස බිහි කරගත් අතර කැරැල්ලෙන් පසු ඇති වූ නව රහසිගත ගම්මාන වර්තමාන ඌව සහ නැගෙනහිර පළාත කේන්ද්‍ර කොට ගෙන විහිදී ඇත. ඒ අතරින් මොනරාගල, බදුල්ල හා අම්පාර යන දිස්ත්‍රික්ක ප්‍රධාන වේ. එහි ගංගා නිම්න හා කඳු වැටි ඔවුන්ගේ වාසභූමි ඉදි කර ගැනීම සඳහා අවශ්‍ය පරිසරය සකස් කර දෙන ලදි. ඒ නිසා ම මෙම ගම්මාන බොහොමයක් උස් කඳුකරයේ කඳු මත හෝ කඳු අතර පිහිටා ඇත. බෞද්ධයන් වශයෙන් පැවති ආගමික විශ්වාසයන්ට අමතරව ඔවුන් විසින් ආරක්ෂා කර ගත් වෙනත් පුදපූජා හා අභිචාර විධි රාශියක් ද එකී ගම්මාන ආශ්‍රිතව දක්නට ලැබේ. මේවා බොහොමයක් ඔවුන්ගේ පාරම්පරික විශ්වාසයනට අනුව සකස් වූ ඒවා වන අතර දෙවියන්, යක්ෂයන්, ප්‍රේතයන්, කුම්භාණ්ඩයන්, පිසාචයන් ඒවායෙහි පිදුම් ලද්දෝ වූහ. මීට අමතරව බෞද්ධ ජනතාවක් වශයෙන් පිරිත් නූලෙන්, පිරිත් පැනින් ලබා ගත හැකි ආරක්ෂාව කෙරෙහි ද විශ්වාසය තැබූ බව කිව හැකිය. මෙකී ගම්මානවල දේව ඇදහීම හා බැඳුණු ප්‍රධාන ශාන්ති කර්මය ගම්මඩුවයි. රෝගවලින් ආරක්ෂාව, වර්ෂාව ලැබීම, ගොවිතැන් සාරවීම, සෞභාග්‍යය ළඟා වීම ආදී හේතු මත මෙකී ශාන්ති කර්මය කරන අතර මෙකී ශාන්ති කර්ම හැරුණු විට ඌවේ ප්‍රසිද්ධ දේවතාවියක් වන පත්තිනි දේවිය උදෙසා කරනු ලබන පුදපූජාවිධි ද රාශියක් විය. පත්තිනි ඇදහීම හා සම්බන්ධ වැදගත් ප්‍රජාවක් වන්නේ කිරිඅම්මා දානයයි. දේවදානයට අමතරව දෙන ප්‍රධාන මේ අනුව ඉහත ගම්මානවල ජනතාවගේ ආගමික ඇදහිලි හා විශ්වාස ඔවුන්ගේ පාරම්පරික පිළිගැනීම් මත පදනම්ව සකස් වූ ඒවා බව පැහැදිලි වේ. මෙකී විශ්වාස බොහොමයක් ඔවුන්ගේ එදිනෙදා ජීවිතයෙහි කටයුතු තීරණය කරන ලද අතර සමාජ හා ආර්ථික ක්‍රමවේදය තීරණය කරන ලද්දේ ද ඒවාය.

**ප්‍රමුඛ පදඃ** උඩරටමහ කැරැල්ල, ගම්බිම් අතහැර පලා ගිය ජනතාව, බෞද්ධ ජනතාවගේ විශ්වාස, ඇදහිලි, පුදපූජා

1 BA. (Colombo) History special, Dip. in HRM
niroshi.niki84@gmail.com